# ④ ව්‍යවසායකත්වය හා කුඩා පරිමාණ ව්‍යාපාර - පිළිතුරු

(1)

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ② | 6. | ① | 11. | ④ |
| 2. | ② | 7. | ③ | 12. | ② |
| 3. | ③ | 8. | ① | 13. | ④ |
| 4. | ② | 9. | ② | 14. | ② |
| 5. | ③ | 10. | ② | 15. | ③ |

(2)

1. පෞද්ගලික හිමිකාරිත්වය යටතේ ස්වාධීනව මෙහෙයවනු ලබන සාපේක්ෂව කුඩා සේවක සංඛ්‍යාවක් හා අඩු ආයෝජනයක් සහිත ව්‍යාපාර වේ.

2.
   1. කුඩා ප්‍රාග්ධනයක් යොදා තිබීම
   2. ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතු වීම
   3. ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට සීමා වී තිබීම
   4. සේවක සංඛ්‍යාව අඩු වීම
   5. තීරණ ගැනීමේ පහසුව

3. ව්‍යවසායකයා නව නිර්මාණ බිහි කරයි.කුඩා පරිමාණයෙන් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමෙන් ඔහුට තම නිර්මාණශීලි අදහස් අත් හදා බැලිය හැක.එමෙන්ම පහසුවෙන් වෙළෙඳපොළ හිඩැස හඳුනාගෙන නව ව්‍යාපාර අවස්ථා ගොඩ නැගිය හැකිය. වර්තමානයේ පවතින බොහෝ මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කර ඇත්තේ ඉතා කුඩා ව්‍යාපාර ලෙසය.

4.
   1) රටෙහි සේවා නියුක්තිය ඉහළයාම තුළින්
   2) ආදායම් බෙදීයාමේ විෂමතාව අඩු වීමෙන්
   3) කාලයාගේ ඇවෑමෙන් මහා පරිමාණ ව්‍යාපාර බවට පත් වීමෙන්
   4) ජාතික නිෂ්පාදිතය ඉහළ යාමෙන්
   5) මහා පරිමාණ ව්‍යාපාර නොසපයන භාණ්ඩ සැපයීම තුළින්
   6) දේශීය දැනුම හා සම්පත් භාවිතයට ගැනීම තුළින්

5.
   1) ප්‍රාග්ධන සම්පාදන මාර්ග සීමා වීම
   2) නවීන තාක්ෂණය භාවිතා නොවීම,
   3) වෙළෙඳපොළ සීමා වීම,ව්‍යාපාර කටයුතු වලට පවුලේ සාමාජිකයන්ගේ අනවශ්‍ය මැදිහත්වීම
   4) ව්‍යාපාර හිමිකරුගේ දැනුම හා පළපුරුද්ද සීමාකාරී වීම

6.

1) ඉතා කුඩා ප්‍රාග්ධනයකින් වුවද ආරම්භ කළ හැකි වීම
2) පරිසර වෙනස් වීම් වලට පහසුවෙන් අනුගත විය හැකි වීම
3) සේවකයන් බඳවා ගැනීම හා පුහුණුව පහසු වීම
4) සේවකයන් ඉහළ වරප්‍රසාද අපේක්ෂා නොකිරීම
5) ගතික පරිසරයට ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ පහසුව

7.

1) ව්‍යාපාර කටයුතු නිවැරදිව සැලසුම් කිරීම
2) ප්‍රවීනයන්ගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීම
3) ගණුදෙණු නිවැරදිව වාර්තා කිරීම
4) බාහිර පරිසරයේ ඇතිවන වෙනස්කම් වලට අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම
5) යහපත් මානව සම්බන්ධතා පවත්වා ගැනීම

8.

1) අයිතිකරුගේ භූමිකාව
2) නායකයාගේ භූමිකාව
3) කළමනාකරුගේ භූමිකාව

9.

1) තාක්ෂණික කුසලතා
2) මානව කුසලතා
3) සංකල්පනාත්මක කුසලතා
4) සන්නිවේදන කුසලතා
5) උපදේශන කුසලතා
6) කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ කුසලතාව

10. ව්‍යවසායකයෙකු යනු සෑම විටම නව්‍යතා බිහි කරන්නෙකි. නව නිෂ්පාදිත බිහි කිරීම, නව වෙළෙඳපොළ සොයා ගැනීමට සහ ව්‍යාපාරික තරඟකාරීත්වයට මුහුණදීමට ව්‍යවසායෙකුට සංකල්පනාත්මක කුසලතා අවශ්‍ය වේ

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව